**1. මොඩියුලයේ නම - ගුරු ආචාර ධර්ම**

**2. ඉලක්ක කණ්ඩායම - ගුරුවරුන්**

**3. අරමුණු -**

- වෘත්තිකයකු වශයෙන් ගුරු ආචාර ධර්ම පිළිපැදීම සඳහා ස්වයං පෙළඹවීමක් ඇති කර ගනී.

- අධ්‍යාපනයේ ගුණාත්මකබව ඉහළ නැංවීමේ දී ගුරුවරයාගේ කාර්යභාරය හා වගකීම් විමර්ශනාත්මකව අවබෝධ කර ගනී.

4. අපේක්ෂිත ඵලය -

ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා සෑම ළමයකුම සතු මූලික අයිතිවාසිකම ගුණාත්මක ගුරුවරයකු තුළින් සුරක්ෂිත කිරීම

5. අන්තර්ගතය

5.1 හැඳින්වීම

ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා සෑම ළමයකුම සතු මූලික අයිතිවාසිකම තහවුරු කිරීම ගුරුවරයා සතු ප්‍රධාන වගකීමකි. ළමයාගේ පරිපූර්ණ පෞරුෂ සංවර්ධනය සඳහා වන ගුරුවරයාගේ දායකත්වය මෙහිලා අත්‍යාවශ්‍ය හා තීරණාත්මක සාධකයක් වේ. එමෙන්ම ගුරුවරුන් දරුවන්ගේ ස්ථානීය දෙමව්පියන් (Loco – parents) යන නීතිමය සංකල්පයට අනුව ශිෂ්‍යයාගේ සුභ සිද්ධියට අදාළ වන අයුරින් කටයුතු කිරීම ද ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරෙන තවත් එක් කාර්යයකි. මෙසේ තම වගකීම් හා යුතුකම් වෘත්තීය විශිෂ්ටත්වය වර්ධනය වන අයුරින් හා සමාජයේ ගෞරවයට පාත්‍රවන අයුරින් ඉටු නිරීමේ දී වෘත්තීය චර්යාධර්මවලට අනුගතව කටයුතු කිරීම ඉතා වැදගත් වේ. ගුරුවරයකු වශයෙන් ස්වයංව පිළිපැදිය යුතු චර්යාමය ප්‍රමිතීන් හා වෘත්තිකයකු වශයෙන් ගුරුවරයකු සතු විය යුතු ස්වයං විනය හා ස්වයං මග පෙන්වීම පිළිබඳව මෙම මොඩියුලයෙන් සාකච්ඡා කෙරේ.

5.2 අනු මාතෘකා

- ගුරු ආචාර ධර්ම හැඳින්වීම - දේශීය සහ ගෝලීය අත්දැකීම් ඇසුරින්

- ගුරු ආචාර ධර්ම - ගුරු භූමිකාවේ හරස්කඩක් ලෙස

- ගුරුවරයා වෘත්තිකයකු ලෙස

- ගුරුවරයා කළමනාකරණය පිළිබඳ වගකිවයුත්තකු ලෙස

- ගුරුවරයා සමාජයේ දේශයේ පෙර ගමන්කරුවකු ලෙස

සැසි සැලැස්ම

| අංකය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම්/සම්පත් | ක්‍රමවේදය | කාලය පැය |
|---|---|---|---|---|---|
| 1 | ගුරු ආචාර ධර්ම හැඳින්වීම - දේශීය සහ ගෝලීය අත්දැකීම් ඇසුරින් | නිර්වචනය<br>වැදගත්කම<br>2012/37 චක්‍රලේඛයේ අන්තර්ගතය සැකෙවින්<br>වෙනත් රටවල ව්‍යවහාරයන් | අත් පත්‍රිකා, multi media projector, computer/ OHP, විනිවිදක කඩදාසි, විනිවිදක පෑන්, ඕමයි කොල, ප්ලැටිග්නම් පෑන්, white board marker | ඉදිරිපත් කිරීම් (presentations), සාකච්ඡා, කණ්ඩායම් පැවරුම් හා ඉදිරිපත් කිරීම් | 04 |
| 2. | ගුරු ආචාර ධර්ම - ගුරු භූමිකාවේ හරස්කඩක් ලෙස | ගුරු භූමිකාව පිළිබඳ කෙටි හැඳින්වීමක්<br>2012/37 චක්‍රලේඛයේ 5.1 සිට 5.5 දක්වා පදනම් කර ගනිමින් ගුරු ආචාර ධර්ම ගුරු භූමිකාව තුළ විසිරී ඇති ආකාරය දැක්වීම | අත් පත්‍රිකා, multi media projector, computer/ OHP, විනිවිදක කඩදාසි, විනිවිදක පෑන්, ඕමයි කොල, ප්ලැටිග්නම් පෑන්, white board marker | ඉදිරිපත් කිරීම් (presentations), සාකච්ඡා, කණ්ඩායම් පැවරුම් හා ඉදිරිපත් කිරීම් | 04 |
| 3. | ගුරුවරයා වෘත්තිකයකු ලෙස | වෘත්තිකභාවය පිළිබඳ කෙටි හැඳින්වීමක්<br>2012/37 චක්‍රලේඛයේ 5.6 පදනම් කර ගනිමින් ගුරුවරයා වෘත්තිකයකු ලෙස ගුරු ආචාර ධර්ම හා සම්බන්ධවන ආකාරය සාකච්ඡා කිරීම | අත් පත්‍රිකා, multi media projector, computer/ OHP, විනිවිදක කඩදාසි, විනිවිදක පෑන්, ඕමයි කොල, ප්ලැටිග්නම් පෑන්, white board marker | ඉදිරිපත් කිරීම් (presentations), සාකච්ඡා, කණ්ඩායම් පැවරුම් හා ඉදිරිපත් කිරීම් | 04 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4. | ගුරුවරයා කළමනාකරණයේ වගකිවයුත්තකු ලෙස | 2012/37 චක්‍රලේඛයේ 5.7 පදනම් කර ගනිමින් ගුරුවරයා කළමනාකරණයේ වගකිවයුත්තකු ලෙසගුරු ආචාර ධර්ම හා සම්බන්ධවන ආකාරය සාකච්ඡා කිරීම | අත් පත්‍රිකා, multi media projector, computer/ OHP, විනිවිදක කඩදාසි, විනිවිදක පෑන්, ඩිමයි කොල, ප්ලැටිග්නම් පෑන්, white board marker | ඉදිරිපත් කිරීම් (presentations), සාකච්ඡා, කණ්ඩායම් පැවරුම් හා ඉදිරිපත් කිරීම් | 04 |
| 5. | ගුරුවරයා සමාජයේ දේශයේ පෙර ගමන්කරුවකු ලෙස | 2012/37 චක්‍රලේඛයේ 5.8 පදනම් කර ගනිමින් ගුරුවරයා සමාජයේ දේශයේ පෙර ගමන්කරුවකු ලෙස ගුරු ආචාර ධර්ම හා සම්බන්ධවන ආකාරය සාකච්ඡා කිරීම | අත් පත්‍රිකා, multi media projector, computer/ OHP, විනිවිදක කඩදාසි, විනිවිදක පෑන්, ඩිමයි කොල, ප්ලැටිග්නම් පෑන්, white board marker | ඉදිරිපත් කිරීම් (presentations), සාකච්ඡා, කණ්ඩායම් පැවරුම් හා ඉදිරිපත් කිරීම් | 04 |

6. වැඩිදුර කියවීම්


- පී. විජේසිරි ගුණසේකර,සාර්ථක ගුරුවරයකු හා ඵලදායී විදුහල්පතිවරයකු වීමට,හයවන මුද්‍රනය,2000
- පී. විජේසිරි ගුණසේකර,පාසල් කළමණාකරනයේ නව ප්‍රවණතා, ප්‍රමුඛතා හා උපායමාර්ග,1997
- පී. විජේසිරි ගුණසේකර,පාසල් ගුණාත්මක සංවර්ධනය, විදුහල්පති හා ගුරු භූමිකාව

## 1. ගුරු ආචාර ධර්ම හැඳින්වීම - දේශීය සහ ගෝලීය අත්දැකීම් ඇසුරින්

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2012/37 චක්‍රලේඛයට අනුව සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතිය ලෙස හඳුන්වන්නේ, තමන් විසින් ම තමන් සඳහාම පනවා ගත යුතු අවංකත්වය, ඍජුබව සහ ආදර්ශවත් සමාජ වගකීම ඇති පුද්ගලයන් වශයෙන් ගුරුවරුන්ගෙන් සමාජය අපේක්ෂා කරන ආකල්ප, වගකීම සහ චාරිත්‍ර වාරිත්‍ර ය. මෙහිදී ගුරුවරයා යනුවෙන් අදහස් කරනු ලබන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය පිළිබඳ ව වගකීමට බැඳී සිටින පාසල් ගුරුවරුන් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය වේ.

- ගුරු ආචාර ධර්ම පද්ධතියක ඇති වැදගත්කම

කණ්ඩායම් ක්‍රියාකාරකම 1

ගුරු ආචාර ධර්ම පද්ධතියක ඇති වැදගත්කම කණ්ඩායම තුළ සාකච්ඡා කර කණ්ඩායම් ඉදිරිපත් කිරීම් සිදු කරන්න.

(කාලය පැය 01)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- පැරණි සමාජයේ ගුරුවරයා සතු ව තිබූ සමාජ ප්‍රතිමානයන් නූතන වාණිජ සමාජය සමග වෙනස් වූ ආකාරය හා නූතන ගුරුවරයාට මුහුණ දීමට සිදුවන සමාජ, ආර්ථික අභියෝගවල දී ගුරු ආචාර ධර්ම පද්ධතියක් තිබීමෙන් ලැබෙන පිටුවහල
- නිදසුන් සපයමින් ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයයේදී මෙන් ම ශිෂ්‍යයාගේ පූර්ණ පෞරුෂ සංවර්ධනයේ දී ගුරුවරයාගේ වගකීම හා වගවීම
- සියලු දරුවන්ට සමාන ලෙස සැලකීමේ මූලධර්මය හා එහි අවශ්‍යතාව
- දෙමව්පියන් ඇතුළු පාසල් ප්‍රජාව සමග කටයුතු කිරීමේ දී ස්වයං විනයෙහි ඇති වැදගත්කම

- 2012/37 චක්‍රලේඛයේ අන්තර්ගතය විමසීම

කණ්ඩායම් ක්‍රියාකාරකම 2

1. ගුරු ආචාර ධර්ම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2012/37 චක්‍රලේඛයේ අන්තර්ගතය විමසා එහි අඩංගු වන ප්‍රධාන කරුණු හඳුනා ගන්න.
2. ඔබේ අත්දැකීම් ඇසුරින් එම කරුණුවල ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(කාලය මිනිත්තු 45)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතුවන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- ගුරු ආචාර ධර්ම පිළිබඳ 2012/37 චක්‍රලේඛය ගුරුවරුන්ගේ සදාචාරාත්මක හැසිරීම පිළිබඳ ආචාර ධර්ම පද්ධතියකින් හා පොදු නීති මාලාවකින් සමන්විතබව
- 2012/37 චක්‍රලේඛයේ අඩංගු වන ප්‍රධාන කරුණු
- එම කරුණුවල ඇති වැදගත්කම

➤ **වෙනත් රටවල ව්‍යවහාරයන්**

ලෝකයේ බොහෝ රටවල වෘත්තිකභාවයේ ප්‍රධාන අංගයක් ලෙස ගුරු ආචාර ධර්ම සැලකේ. මෙම ආචාර ධර්ම පද්ධතීන්ගේ අන්තර්ගතය සැලකීමේ දී වෘත්තියට දක්වන අවංකබව, වෘත්තියමය වගවීම, වගකීම වැනි බොහෝ දුරට සමාන කරුණු දක්නට ලැබේ. එමෙන්ම, ගුරු ආචාර ධර්ම සකස් කිරීමේ දී රජය මෙන්ම ගුරු වෘත්තීය සංවිධාන මූලිකත්වය ගෙන ඇති අවස්ථා ද ඇත. වෙනත් රටවල ව්‍යවහාර කිහිපයක් පහත සඳහන් වේ.

1. වික්ටෝරියා ප්‍රාන්තය, ඕස්ට්‍රේලියාව (Code of conduct for teaching profession – State of Victoria, Australia)

මෙම ගුරු ආචාර ධර්ම පද්ධතිය, ප්‍රජාව සහ අනෙකුත් වෘත්තීය සගයන් විසින් ගුරුවරයකුගෙන් අපේක්ෂා කෙරෙන වෘත්තීය හැසිරීම, පෞද්ගලික හැසිරීම හා වෘත්තීය නිපුණතාවට අදාළ වන මූලධර්ම කිහිපයක් පදනම් කර ගනිමින් සකස් කර ඇත. අවංකභාවය, ගරු කිරීම හා වගකීම යන ප්‍රධාන සාරධර්ම තුන ඔස්සේ එම ගුරු ආචාර ධර්ම විහිදී යයි.

වෘත්තීය හැසිරීම යන්නෙන් ගුරුවරයා තම ශිෂ්‍යයින් , ශිෂ්‍යයින්ගේ දෙමව්පියන් සහ පවුල්, ප්‍රජාව සහ තම වෘත්තීය සගයන් සමග පවත්වා ගත යුතු ගුණාත්මක සම්බන්ධතාව අදහස් වේ. ගුරුවරයකුගේ පෞද්ගලික හැසිරීම ගුරුවරයාගේ වෘත්තිය තත්ත්වය කෙරෙහි මෙන් ම සමස්තයක් ලෙස ගුරු වෘත්තිය කෙරෙහි ම බලපෑමක් ඇති කරයි. එමනිසා ගුරුවරයා සියලු දෙනාට ආදර්ශයට ගත හැකි අයකු වීම ඉතා වැදගත් වේ. වෘත්තීය නිපුණතාව යටතේ ගුරුවරයා තම වෘත්තිකභාවය ඉතා ඉහළින් අගය කරන අතර ඒ සම්බන්ධ ඉහළ ප්‍රමිති මට්ටම් හඳුනා ගැනීම හා පවත්වා ගෙන යෑම සිදු කරයි. ගුරුවරයා තම වෘත්තියට අදාළ වන නීතිමය ප්‍රතිපාදන හා තම නෛතික වගකීම් පිළිබඳ ව දැනුවත්බවින් යුක්තය.

2. ඉන්දියාව

ගුරුවරුන් සඳහා වෘත්තීය ආචාර ධර්ම පද්ධතිය මග පෙන්වීමක් සහ දිශානතිය සැපයීමක් ලෙස හඳුන්වා ඇත. ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි වන බැඳීම්, දෙමව්පියන්, ප්‍රජාව සහ සමාජය කෙරෙහි වන බැඳීම්,වෘත්තීය සහ වෘත්තීය සගයන් කෙරෙහි වන බැඳීම් පදනම් කර ගනිමින් සකස් කර ඇත. ගුරු ප්‍රතිඥාවක් ද අන්තර්ගත වේ.

කණ්ඩායම් ක්‍රියාකාරකම 3

1. විවිධ රටවල අත්දැකීම් සමග සසඳා බලා 2012/37 චක්‍රලේඛය තවදුරටත් වැඩි දියුණු කළ හැකි ආකාරය කණ්ඩායම තුළ සාකච්ඡා කර ඉදිරිපත් කරන්න.

(කාලය මිනිත්තු 45)

**2.ගුරු ආචාර ධර්ම - ගුරු භූමිකාවේ හරස්කඩක් ලෙස**

ලෝකයේ කොතැනක වුවද ගුරුවරයා සමාජමය සංකේතයක් ලෙස සැලකේ. 'අධ්‍යාපනය යනු ගුරුවරයාය: ගුරුවරයා යනු අධ්‍යාපනයයි' වැනි කියමන් බිහිවී ඇත්තේ ද ගුරු භූමිකාවේ කාර්යභාරයත් ඒ හා බැඳී ඇති සමාජ මෙහෙවරත් සැලකිල්ලට ගනිමිනි.

"කිසියම් පුද්ගලයකුට ඔහු සේවය කරන ආයතනයේ/ සංවිධානයේ තමාට ලැබී ඇති තනතුර අනුව ඔහු විසින් ඉටු කළ යුතුයැයි එම සංවිධානය තුළ සේවය කරන හා සංවිධානය තුළින් සේවය ලබන සියලුම දෙනා ඔහුගෙන් බලාපොරොත්තු වන මෙහෙය, පුද්ගලයා සතු භූමිකාව ලෙස සරලව අර්ථ දැක්විය හැකිය." (පී. විජේසිරි ගුණසේකර,සාර්ථක ගුරුවරයකු හා ඵලදායී විදුහල්පතිවරයකු වීමට, පිටුව 4)

භූමිකාධාරියකුගේ වැඩ කිරීමේ විධි,අන්තර් පුද්ගල හර, සමාජීය හා චිත්තවේගීය හර, කරුණාවන්තබව, කථාව, හැසිරීම, ආදිය සම්බන්ධ ප්‍රතිමාන කිසියම් භූමිකාවක රංගනය සම්බන්ධයෙන් මෙන් ම එහි පැවැත්ම කෙරෙහිද බලපායි. (පී. විජේසිරි ගුණසේකර,පාසල් කළමනාකරණයේ නව ප්‍රවණතා, ප්‍රමුඛතා හා උපායමාර්ග, පිටුව 167)

එමනිසා ගුරු ආචාර ධර්ම හා ගුරු භූමිකාව එකිනෙකින් වෙන් කර සැලකිය නොහැකි අතර ගුරු ආචාර ධර්ම ගුරු භූමිකාව ඔස්සේ විහිදී පවතී.

1. ගුරුවරයා පුද්ගලයකු වශයෙන් හා ගුරුවරයා "දෙමව්පියන් වශයෙන්"

   කණ්ඩායම් ක්‍රියාකාරකම 1

   "ගුරුවරයා පාසල තුළ පමණක් නොව සමාජයේ ද භූමිකා ආදර්ශයක් (Role model) විය යුතු වේ." මේ පිළිබඳව නිදසුන් සපයමින් අදහස් දක්වන්න.

(කාලය පැය 01)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- අන්‍යයන් හට ඔවුන් තුළ පවතින උපරිම විභව්‍යතා මතු කර ගනිමින් ජීවිතයේ සාර්ථකත්වය කරා යැමට ඔවුන් පොළඹවන හා දිරිමත් කරන පුද්ගලයකු භූමිකා ආදර්ශයක් ලෙස හැඳින්විය හැකිය.

- 2012/37 චක්‍රලේඛයේ 5.1 හා 5.2 යටතේ අඩංගු කරුණු

2. ගුරුවරයා දැනුම ලබා දෙන්නකු, කුසලතා හා ආකල්ප සංවර්ධනය කරන්නකු ලෙස

ගුරුවරයා නිර්මාණාත්මක **මග පෙන්වන්නකු සහ උපදේශකයකු ලෙස**

ගුරුවරයා ඇගයීම් කරන්නකු ලෙස

කණ්ඩායම් ක්‍රියාකාරකම 2

ගුරුවරයාගේ ඉගැන්වීමේ ශෛලිය හා ශිෂ්‍යයාගේ ඉගෙනීමේ ශෛලිය සාර්ථක ව ගලපා ගැනීමෙන් ශිෂ්‍යයාගේ ඉගෙනීම වඩා ඵලදායී ලෙස සිදු වේ. ගුරු ආචාර ධර්ම සම්බන්ධ කර ගනිමින් මෙම කරුණ සාකච්ඡා කරන්න.

(කාලය පැය 01)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරුවරයාගේ ඒකාධිකාරී බලය මත සිදු කරනු ලබන 'ඉගැන්වීමේ' ක්‍රියාවලියක් නොවන අතර එය ගුරුවරයා සහ ශිෂ්‍යයා අතර සහයෝගයෙන් සිදු වන ක්‍රියාවලියක් බව
- එමනිසා **ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමෙහි** ඇති වැදගත්කම හා එහි දී ගුරුවරයා සුසාධ්‍යකාරකයකු ලෙස, සම්පත්දායකයකු ලෙස, ආදී වශයෙන් සිදු කරනු ලබන කාර්යභාරය
- ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමෙහි දී තක්සේරුකරණය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ම කොටසක් බව
- ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිවල ඇති විවිධත්වය

  Neil Fleming විසින් ඉදිරිපත් කර ඇති ඉගෙනුම් ශෛලි ආකෘතිය අනුව (VARK model) සිසුන් කාණ්ඩ හතරකට බෙදිය හැකි ය.

  - රූපසටහන්, ප්‍රස්තාර වැනි දෘශ්‍යමය ආධාරක ඇසුරින් පහසුවෙන් ඉගෙන ගන්නා සිසුන් (visual learners)
  - සවන් දීමෙන්, කණ්ඩායම් සාකච්ඡා ආදිය මගින් වඩා පහසුවෙන් ඉගෙනීම සිදු කරන සිසුන් (auditory learners)
  - ලිවීම,කියවීම, කෙටි සටහන් ලිවීම ආදිය මගින් වඩා පහසුවෙන් ඉගෙනීම සිදු කරන සිසුන් (Read and write learners)
  - ක්‍රියාකාරකම් සිදු කිරීම වැනි චාලක ක්‍රියා තුළින් වඩා පහසුවෙන් ඉගෙනීම සිදු කරන සිසුන් (kinesthetic learners)

- 2012/37 චක්‍රලේඛයේ 5.3, 5.4 හා 5.5 යටතේ අඩංගු කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගුරුවරයාගේ කාර්යභාරය සමග ගුරු ආචාර ධර්මවල විවිධ මානයන් සම්බන්ධ කිරීම

## 3. ගුරුවරයා වෘත්තිකයකු ලෙස

කණ්ඩායම් ක්‍රියාකාරකම 1

වෘත්තිකයකු වශයෙන් ගුරුවරයා සතු වගකීම (Responsibility) සහ වගවීම (Accountability) පිළිබඳව නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.

(කාලය පැය 01)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- යම් කාර්යයක් ඉටු කිරීම සඳහා පවරා දීම හෝ තමා විසින් පවරා ගැනීම වශයෙන් වගකීම යන්න සරල වශයෙන් දැක්විය හැකිය. එමෙන්ම වගකීම පුද්ගල, සාමූහික හෝ ආයතනික හෝ විය හැකි ය.

- කිසියම් පුද්ගලයකු තමාට පැවරී තිබූ කාර්යයක ප්‍රතිඵල සම්බන්ධයෙන් තමාට ඉහළින් සිටින අයට මෙන්ම තමාට පහළින් සිටින අයට ද කරුණු දැක්වීමට බැඳී සිටීම වගවීම යන්නෙන් අදහස් වේ. වෘත්තීය වගවීම යන සංකල්පය අනෙක් වගවීම් සංකල්පයන් වන කොන්ත්‍රාත්මය වගවීම, සදාචාරාත්මක වගවීම, මූල්‍යමය වගවීම හා දේශපාලනමය වගවීම යන සියල්ල අභිබවා යයි.

- 2012/37 චක්‍රලේඛයේ 5.6 යටතේ අඩංගු කරුණු

කණ්ඩායම් ක්‍රියාකාරකම 2

ගුරු සහයෝගීතාව (Teacher collaboration) යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? ගුරු සහයෝගීතාවයෙහි ඇති වැදගත්කම හා ගුරු සහයෝගීතාව වර්ධනය කළ හැකි අවස්ථා සාකච්ඡා කරන්න.

(කාලය පැය 01)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- ඉගෙනුම් ප්‍රජාවක සාමාජිකයින් ලෙස පොදු දැක්මක් (shared vision) සහිත ව එම දැක්ම සහ අරමුණු ඉටු කර ගැනීමට සියලු දෙනා සමාන ලෙස එක් ව කටයුතු කිරීම සහයෝගීතාව (collaboration) ලෙස හැඳින්විය හැකිය.

- සාර්ථක ගුරු සහයෝගීතාවක දී පහත සඳහන් දේ දැකිය හැකි ය.

    - සහයෝගීතාව ස්වේච්ඡාවෙන් සිදුවන්නකි.

    - එහිදී සියලු දෙනා සමාන ලෙස සැලකීම අවශ්‍ය වේ.

    - සහයෝගීතාව සාමාජිකයන්ගේ අන්‍යෝන්‍ය අරමුණු මත පදනම් වී ඇත.

    - සහයෝගීතාව තීරණ ගැනීමේ හා ක්‍රියාකාරී ව සහභාගී වීමේ සාමූහික වගකීම මත රැඳී ඇත.

- තම තමන් සතු සම්පත් අන්‍යයන් සමග බෙදා ගනී.
- ලැබෙන ප්‍රතිඵල සම්බන්ධයෙන් සියලු දෙනා තනි තනි ව වග වේ.

- සහයෝගීතාව තුළින් එකිනෙකාගේ දැනුම් සහ වටිනාකම් බෙදා හදා ගැනීම සිදුවේ. පුද්ගල අන්තර් සම්බන්ධතා හා අන්‍යෝන්‍ය බැඳීම් තහවුරු වීම සහ ශක්තිමත් වීම සිදුවේ.

- එක් ව සැලසුම් කිරීම (co – planning) හා එක් ව ඉගැන්වීම (co – teaching) සිදු කරයි. ශිෂ්‍ය සාධනය ඉහළ යයි. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකබව වැඩිවේ.

- තත්ව කව, ගුරු මණ්ඩල සාකච්ඡා, ශිෂ්‍ය කඳවුරු ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම්, විෂය සංවර්ධන වැඩසටහන් ආදිය ගුරු සහයෝගීතාව ඇති කළ හැකි අවස්ථා වශයෙන් සහාය කර ගත හැකිය.

**4. ගුරුවරයා කළමනාකරණය පිළිබඳ වගකිවයුත්තකු ලෙස**

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව හා ඵලදායී ලෙස ඉටු කිරීමට නම් එහි සෑම පියවරක් ම ඉතා මැනවින් කළමනාකරණය කිරීම අවශ්‍ය වේ. මැනවින් සංවිධානය කරන ලද පන්ති කාමරයක් තුළින් උසස් සාධන මට්ටමක් සහිත සිසුන් බිහි කිරීමට හැකි බව පර්යේෂණවලින් ද පෙන්වා ඇත. Dalin (1978) පැවසූ පරිදි, අධ්‍යාපනික ආයතන (පාසල්) සංකීර්ණ සංවිධාන වන්නේ වෙනස් වන තාක්ෂණයේ සංකීර්ණ බව නිසා නොවේ. වේගයෙන් වෙනස්වන පරිසරයක ඉටු කිරීමට සිදුවී ඇති සංකීර්ණ මෙහෙවර නිසා ය.

කණ්ඩායම් ක්‍රියාකාරකම 1

පන්ති කාමර කළමනාකරණයේ දී ගුරුවරයකු විසින් සැලකිල්ලට ගත යුතු ආචාර ධර්ම කවරේ ද? හේතු දක්වමින් සාකච්ඡා කරන්න.

(කාලය පැය 01)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- පන්තිය සකස් කිරීමේ දී ගැටලු හා දුබලතා (පෙනීමේ, ඇසීමේ ආදී ) සහිත සිසුන් පිළිබඳව අවධානය යොමු කිරීම
- පන්තියට වාතාශ්‍රය, ආලෝකය මැනවින් ලැබෙන පරිදි සකස් කර ගැනීම
- සියලු ම සිසුන්ට සමාන ලෙස අවධානය ලබා දීම හා ඇහුම්කන් දීම
- ප්‍රශ්ණ ඇසීම, පිළිතුරු ලබා ගැනීම, අහඹු ලෙස අභ්‍යාස පොත් ලකුණු කිරීම ආදියේ දී සෑම සිසුවකුට ම අවස්ථාවක් ලැබෙන බවට වග බලා ගැනීම
- කළුලෑල්ල භාවිත කිරීමේ දී අකුරුවල ප්‍රමාණය, පැහැදිලිබව ආදිය පිළිබඳ ව සැලකිලිමත් වීම
- හඬ, උච්චාරණය පැහැදිලි වීම

- ආසන්න පන්ති කාමරවලට හා සිසුන්ට අවහිරයක් නොවන පරිදි තම පන්තියේ කටයුතු පවත්වා ගෙන යෑම

- කාල කළමනාකරණය
- පන්ති කාමර සම්පත් කළමනාකරණය

කණ්ඩායම් ක්‍රියාකාරකම 2

කළමනාකරුවකු වශයෙන් ගුරුවරයාගේ වගකීම් හා වගවීම් කවරේ ද? හේතු දක්වමින් සාකච්ඡා කරන්න.

(කාලය පැය 01)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම හා ශිෂ්‍යයාගේ පූර්ණ පෞරුෂ සංවර්ධනය (ගුරුවරයා සිසු ප්‍රගතියේ නියමුවා ලෙස)
- ගුරු සිසු සබඳතා, උපදේශනය හා ශිෂ්‍ය සුභ සාධනය සම්බන්ධ කටයුතු
- විෂය සමගාමී කටයුතුවල නිරත වීම
- පාසලේ ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් හදිසි අවස්ථා කළමනාකරණය
- සිසු පැමිණීමේ ලේඛනය නඩත්තු කිරීම, දෛනික රාජකාරි ඉටු කිරීම, අදාළ ලේඛණ සම්පූර්ණ කිරීම වැනි පරිපාලන වගකීම් හා වගවීම්
- සිසු විනය පවත්වා ගැනීම සම්බන්ධ වගකීම් හා වගවීම්
- ක්‍රමවත් ඉගැන්වීමක් සඳහා සූදානම හා සංවිධානය
- පාසල් ප්‍රජාව සමග සම්බන්ධතා
- 2012/37 චක්‍රල්ඛයේ 5.7 යටතේ අඩංගු කරුණු

**5. ගුරුවරයා සමාජයේ /දේශයේ පෙර ගමන්කරුවකු ලෙස**

කණ්ඩායම් ක්‍රියාකාරකම 1

එදිනෙදා පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය පුවත් අතර ළමුන් මත් ද්‍රව්‍ය භාවිත කිරීම්, අන්තර්ජාලය අනිසි ලෙස පරිහරණය කිරීම්, දිවි නසා ගැනීම් වැනි පුවත් බහුලව අසන්නට දකින්නට ලැබේ. මෙබඳු සිදුවීම් අවම කර ගැනීම සඳහා ගුරුවරයා සතු කාර්යභාරය සාකච්ඡා කරන්න

(කාලය මිනිත්තු 45)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- නිවැරදි තීරණ ගැනීමේ හැකියාව සිසුන් තුළ සංවර්ධනය කිරීම
- විචාරශීලී ව සිතීමේ කුසලතා සංවර්ධනය කිරීම
- සමාජ ගැටලු පිළිබඳ ව සිසුන් සමග සුහද ලෙස සාකච්ඡා කිරීම හා ආදීනව පිළිබඳ ව දැනුවත් කිරීම (එක් එක් සිසුවාට මෙබඳු පුවත් අසන විට තමන්ට සිතුනු දෙය, කළ යුතු යැයි හැඟුණු දෙය යනාදිය ගැන කථා කිරීමට ඉඩදීම ආරම්භයක් ලෙස ගත හැකි ය.)
- උපදේශනය
- සිසුන් තුළ නායකත්ව කුසලතා සංවර්ධනය
- විවේකය ඵලදායී ලෙස ගත කිරීමට සිසුන් හට මග පෙන්වීම
- සමාජ කුසලතා සිසුන් හට ලබා දීම

කණ්ඩායම් ක්‍රියාකාරකම 2

සමාජ සංහිදියාව ඇති කිරීමෙහි ලා ගුරුවරයා පෙර ගමන් කරුවෙකි. නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

(කාලය මිනිත්තු 45)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- විවිධ සංස්කෘතීන්ගේ හරයන් පිළිබඳව සිසුන් දැනුවත් කරමින් සංස්කෘතික විවිධත්වයට ගරු කිරීමට සිසුන් හුරු කිරීම
- විවිධ ආගම් පිළිබඳ ව සිසුන් දැනුවත් කරමින් ආගමික විවිධත්වයට ගරු කිරීමට සිසුන් හුරු කිරීම
- විවිධ භාෂා පිළිබඳ ව සිසුන් දැනුවත් කරමින් භාෂා විවිධත්වයට ගරු කිරීමට සිසුන් හුරු කිරීම

කණ්ඩායම් ක්‍රියාකාරකම 3

විසි එක්වෙනි සියවස සඳහා අවශ්‍ය කුසලතා සිසුන්ට ලබා දීමේ අභියෝගය ගුරුවරයා විසින් ජය ගන්නේ කෙසේ ද?

(කාලය මිනිත්තු 45)

කණ්ඩායම් ඉදිරිපත් කිරීමෙන් පසු පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.

- සිතීමේ විලාසය - නිර්මාණශීලීබව, නව චින්තනයන්, විචාරශීලී චින්තනය, ගැටලු විසඳීමේ කුසලතා, නිවැරදි තීරණ ගැනීමේ කුසලතා සහ ඉගෙනුමට ඉගෙනුම
- වැඩ කිරීමේ විලාශය - සන්නිවේදනය, සහයෝගීතාව, කණ්ඩායම් ක්‍රියාකාරකම්
- වැඩ කිරීමේ මෙවලම් - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය වැනි
- ලෝකයේ ජීවත්වීම - පුරවැසියකු වීම, පෞද්ගලික, වෘත්තීය හා සමාජ වගකීම්, සංස්කෘතික සංවේදීබව හා නිපුණතා
- 2012/37 චක්‍රල්ඛයේ 5.8 යටතේ අඩංගු කරුණු